# ශ්‍රී ලාංකේය ව්‍යවහාරික බුද්ධාගම විෂයයෙහි බෞද්ධ පූජා චාරිත්‍රවල උපයෝගීතාව

එච්.ජී.ජී. හර්ෂිකා - බෞද්ධ අධ්‍යයනාංශය

බෞද්ධ සමාජයෙහි පවතින පූජා චාරිත්‍ර පිළිබඳව ඇතැම් අයෙකුගේ චිනත්නය විහිදී ඇත්තේ එය නිරර්ථක ක්‍රියාවක් ලෙසිනි. එය බුදුසමයට හා බෞද්ධ දර්ශනයට ඉතා හානිදායක පැවැත්මක් බව ඇතැමුන්ගේ විශ්වාසයයි. එසේවුවත් පූජා චාරිත්‍ර බෞද්ධ සමාජයේ ප්‍රබල භූමිකාවක් ඉටු කරමින් පවතී. මෙම පසුබිම පාදක කර ගනිමින්, ශ්‍රී ලාංකේය ව්‍යවහාරික බුද්ධාගමෙහි පූජා චාරිත්‍රවල පැවැත්ම වඩාත් ප්‍රබල අයුරින් සමාජයෙහි ස්ථාවරව පවතින්නේ ඇයි? යන ගැටලුවට විසඳුම් සෙවීම, මෙම පර්යේෂණයෙන් සිදු කෙරිණි. මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වූයේ පූජා චාරිත්‍ර හා සමාජානුයෝජනය අතර පවතින සම්බන්ධතාව හඳුනා ගැනීමයි. මෙම පර්යේෂණය, තොරතුරු හා දත්ත නිවැරදිව ලබා ගැනීමේ අරමුණින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුව සිදු කරන ලදි. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ත්‍රිපිටකය, මහාවංසය වැනි ග්‍රන්ථ භාවිත කරනු ලැබූ අතර, විද්වත් පර්යේෂණයන්ද සඟරා ආශ්‍රිත ලිපිද අන්තර්ජාලයද ද්විතියික මූලාශ්‍ර වශයෙන් ගනු ලැබීය. ඒ අනුව මුල් බුදුසමය සහ ව්‍යවහාරික බුද්ධාගම අතර පවතින මූලික වෙනස්කම් හඳුනා ගැනීමෙන් ශ්‍රී ලාංකේය ව්‍යවහාරික බුද්ධාගමෙහි විද්‍යමාන පූජා චාරිත්‍රවල වර්ධනීය ස්වභාවය හඳුනා ගන්නා ලදි. පූජා චාරිත්‍ර හා සමාජානුයෝජනය අතර පවතින සම්බන්ධතාව හඳුනා ගත් අතර සමාජානුයෝජන කාරකයක් වශයෙන් ආගමෙහි ක්‍රියාකාරිත්වය සඳහා පූජා චාරිත්‍රවල බලපෑම ශ්‍රී ලාංකේය බෞද්ධ සමාජය ඇසුරින් නිරූපණය කරන ලදි. ඒ අනුව පූජා චාරිත්‍ර හා බැඳී පවතින සෑම ක්‍රියාවලියක්ම සමාජයීය වශයෙන් පුද්ගලයා වෙත බලපෑම් කරන ආකාරය හඳුනාගත හැකිය. එහිදී විනය ගරුකත්වය හා සමාජ පාලනයට පුද්ගල සමාජ අන්තර්සම්බන්ධතාව ගොඩනැඟීමට පුද්ගල පෞරුෂත්වය හා චරිත සංවර්ධනයට සහ ජීවන රටා දිශාගත කිරීමට පූජා චාරිත්‍ර ඉවහල් වන ආකාරය මූලික වශයෙන් හඳුනාගත හැකි විය. ඒ අනුව යථෝක්ත කරුණු පදනම් කර ගනිමින් පූජා චාරිත්‍රවල දක්නට ලැබෙන සමාජයීය කෘත්‍යය, ශ්‍රී ලාංකේය ව්‍යවහාරික බුද්ධාගමෙහි පූජා චාරිත්‍රවල පැවැත්ම වඩාත් ස්ථාවරත්වයට පත් කිරීමට ඉවහල් වූ බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** *මුල් බුදුසමය, ව්‍යවහාරික බුද්ධාගම, පූජා චාරිත්‍ර, සමාජානුයෝජනය, සමාජයීය කෘත්‍යය*